අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk

2025.01.27 මාධ්‍ය නිවේදන අංක: 2025/010

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුගේ අපේක්ෂිත ඇප ඉල්ලීම කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කෙරේ.</u>**

ශ්‍රී ලංකාවේ රේගුවේ නිශ්කාෂනය නොවී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ වාහන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කරගෙන යනු ලබන විමර්ශන කටයුතුවලට අදාළව HG – 5087 දරණ මෝටර් රථය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමේ දී ඉහත වාහනය අංකය යටතේ පළමුවෙන් ම ලොරි රථයක් ලියාපදිංචිව තිබී 2022.08.15 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හම්බන්තොට කාර්යාලය මගින් ජීප් රථයක් සඳහා ලියාපදිංචි සහතිකයක් අනීතික ලෙස නිකුත් කර ඇත. එම ලියාපදිංචි සහතිකය අනුමත කිරීම සහ මුද්‍රණය කිරීම සිදු කළ බවට මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු සම්බන්ධයෙන් විමර්ශනය සිදු කරනු ලබයි.

මීට අදාළව ඔහු විසින් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 36333/1/255 යටතේ 1997 අංක 30 දරණ ඇප පනතේ 21 වගන්තිය යටතේ අත් අඩංගුවට ගැනීම වළක්වාලමින් අපේක්ෂිත ඇප ඉල්ලීමක් සිදු කළ අතර, එම ඉල්ලීම 2025.01.22 වන දින විවෘත අධිකරණයේ කැඳවා දෙපාර්ශ්වයේ ම කරුණු සලකා බලා අදාළ ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

ඊට අදාළ ප්‍රශ්නගත රථය මීට පෙර අත් අඩංගුවට ගෙන අදාළ බදු මුදල් අය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය**
0112502672